# භූත කාමර්ය



උමේෂි අයන්සා වනිගසේකර

# භූත කාමරය

උමේෂි අයන්සා වනිගසේකර

## කතෘගේ වෙනත් කෘති

ඩයිනසෝර්ගේ කතාව

මාෂිගේ උපන්දින තෑග්ග

වලස් පවුල

පුංචි කතාවක් කියවමු

රචනාවක හැඩ බලමු

**පුෂ්පදාන බාලිකා විද්‍යාලය, මහනුවර**

6 ශ්‍රේණිය

2025 පෙබරවාරි 22

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි  ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන්  සමත්වීම  සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි.  ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය` මහනුවර

## ගමේ විත්ති

මිනායා සහ ලිලි වාසය කරන්නේ රන්මඩ කියන ලස්සන ගම්මානයේ. කඳුවැටි වලින් සහ කෙත්වතු වලින් සපිරි මේ ගම්මානයේ පසෙකින් පිහිටි නෙට්‍රන් ඇල්ල කියන සුන්දර දියඇල්ල නිසා ගම්මානය තවත් රමණීය වී ඇත.

ඉතා කරුණාවන්ත හැමෝගේම සිත් දිනාගෙන සිටින මිනායා වයස අවුරුදු 12ක පුංචි ගැහැණු දරුවෙකි. ඇයගේ පියා නගරයේ දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කරන අතර මව ගෘහනියකි.

ලිලි ද ඉතා හුරුබුහුටි වයස අවුරුදු 12 ක් වන පුංචි ගැහැණු දරුවෙකි. ඇයගේ දෙමාපියන් ගුරුවරු වේ. මිනායා සහ ලිලි එකම පාසලේ එකම පන්තියේ ඉගෙනුම ලබන හොදම යහලුවන් වේ. දෙදෙනාගේ ම දෙමව්පියන් ඉතා සමීපව කටයුතු කරන හිතවතුන් ද වේ.



මේ අතර මිනායාගේ පියා දවසක් සවස නිවසට කලබලයෙන් මෙන් ඇතුලු විය.

“මට ට්‍රාන්සර් එක්ක ඇවිත්. ටිකක් දුරකට. අපිට එහෙට යන්න වෙනවා.”

ඔහු මිනායාගේ මවට පැවසුවේය.

“ඒ කොහේටද? කවදද යන්න ඕනේ?” මිනායාගේ මව ඇසුවාය.

“ලබන සතියේම යන්න වෙනවා අපිට” මිනායාගේ පියා පැවසුවා.

“අනේ තාත්ති එතකොට අපි මෙහෙ අතඇරලා යනවාද?” මිනායා කලබල වි ඇසුවාය.

“ඔව් මගේ පුතේ. අපි තුන්දෙනාම යනවා අපි එහෙන් ඉස්කෝලයක් බලමු.” මිනායාගේ පියා පැවසුවා

මිනායාට ගොඩක් දුක හිතුනේ ලිලි දාලා යන්න. මිනායා දුවගෙන ගිහින් ලිලිට කිව්වා එයාව දාලා යන්න වෙනවා කියලා. ලිලිටත් ගොඩක් දුක හිතුණා එයාගේ හොදම යාලුවා නැතිවෙන නිසා.

දවස් කිහිපයකින් මිනායාගේ දෙමව්පියෝ රන්මඩ ගමට සමුදෙන්න සුදානම් වුණා. එයාගේ නිවසේ

සියලුම බඩු ලොරියක පටවාගත්තා. ලිලිගේ දෙමව්පියෝ ද මිනායාගේ දෙමව්පියන්ට උදව් කරන්න පැමිණ සිටියා. බඩු බාහිරාදිය සියල්ල පටවා අවසානයේ මිනායා සහ පවුලේ අය ද පිටත් වීමට සූදානමින් සහායට පැමිණ සිටි සියලු දෙනාට මිනායාගේ පියා ස්තුතිවන්ත වුණා.

ලිලිගේ මව වෙත ගිය මිනායාගේ මව "එහෙනම් අක්කේ අපි ගිහින් එන්නම් අපි ඉක්මනින්ම අයෙත් හමුවෙමු" කිවාය.

"ඔව් නංගි අපි ඉක්මනින්ම හමුවෙමු ඔයාලා හැමෝම පරිස්සමින් ඉන්න" ලිලිගේ මව දුක්මුසු මුහුණින් පැවසුවාය.

මෙතෙක් වෙලාවක් සඟවාගෙන සිටි තෑග්ගත් රැගෙන ලිලි මිනායා ළගට ගියා.

"මට ඔයා නැතුව ගොඩක් පාළු දැනෙයි. මාව මතක් වෙන්න මේ චූටි තෑග්ග තියාගන්න මිනායා"

"තැන්ක්යු ලිලි. මටත් ඔයා නැතුව ගොඩක් පාළු දැනෙයි" මිනායා කඳුලු සලමින් පැවසුවාය.

මිතුරියන් දෙදෙනා ම අඬමින් සමුගත්තෝය.

# අලුත් නවාතැන

අලුත් ගමට ගිය මිනායලාට නවතින්න නිල නිවසක් ලැබුනා. ඒක තරමක් ලොකු ගෙයක්. කාමර 5 ක් තිබුණා. ලොකු සාලයක් ලොකු මුලුතැන්ගෙයක් සහ කෑම කාමරයක් තිබුණා. ඒ ගේ ඉස්සරහ ලොකු මිදුලක් තිබුණා. නිවස තුල දිස්වුයේ අඳුරු ස්වභාවයක්. කාලෙකින් කවුරුත් වාසය කර නොමැති බවක් ද දිස්වෙයි.

නිවස සුද්ද පවිත්‍ර කර තමන් ගෙනා බඩු බාහිරාදිය අස්පස් කර ඔවුන් තිදෙනා වෙනුවෙන් එක් නිදන කාමරයක් වෙන්කර ගත්තා. පසුදින සිටම පියා රාජකාරි සඳහා පිටත්විම නිසා පුංචි මිනායාට දවල් කාලයේ පාලුවක් දැනුනි.

මිනායා අම්මා ලඟට ගියා.

"අම්මේ මට ලිලිට කතා කරන්න ඕනේ. අපි කෝල් එක්ක ගමුද?" මිනායා අම්මාගෙන් ඇසුවාය.

"ඔයාට පාළුයි නේද මගේ පුතේ. ඉන්න අපි කෝල් එකක් ගමු" කී අම්මා ලිලිගේ මවගේ දුරකථනයට වට්ස්ඇප් ඇමතුමක් ගත්තාය.

ලිලිගේ මව ඇමතුමට පිලිතුරු දෙමින් දුරකථනයට ලිලි අතට දුන්නාය.

මිනායා දුරකථනයෙන් ලිලි සමගින් කථා කරමින් එලියට ආවාය.

“ලිලි ඔයාට මන් අපේ ගේ පෙන්නන්ද? ඒක හරිම ලොකු ගෙයක් අනේ. සමහර තැන්වල මම තාම ඇවිදලවත් නෑ” මිනායා ලිලිට පැවසුවාය.

“අනේ එහෙමද මටත් පෙන්නන්කෝ අනේ මට බලන්න ආසයි” ලිලි පැවසුවාය.

මිනායා දුරකථනයෙන් නිවසේ බොහෝ තැන් ලිලිට පෙන්වමින් විස්තර කළාය.

මිනාය පෙන්වූ නිවස ගැන ලිලි නම් එතරම් සතුටු වුනේ නෑ. හැබැයි එයා ඒ බවක් මිනායාට පෙන්වුවෙත් නෑ.

# අමුතු කාමරයක්

පාසල් නිවාඩු කාලය නිසා මිනායා හරිම කම්මැලි කමෙන් දවස ගෙව්වේ. මිනායා ගේ පුරා ඇවිද්දා එතකොට මිනායා දැක්කා එක පොඩි කාමරයක් කෑම කාමරය ළගම තියෙනවා ඒකේ දොර වහලා තිබ්බෙ. මිනායා ඒක කලින් දැකලා තිබුනේ නෑ. මිනායාට ඒක ඇරලා බලන්න හිතුනා. මිනායා ඒ දොර අරින්න ලොක් එකට අත තියනකොටම

"මිනායා එන්න පුතේ කෑම කන්න" අම්මා මිනායාට කථා කරා.

"හරි අම්මේ මේ එනවා" මිනායා කෑම කන්න ගියා.

පසුදින ද මිනායා කම්මැලි කමින් දවස ගෙවන්න ගත්තා. මිනායාට එකපාරටම අර කාමරය මතක් වුණා. මිනායා කාමරය අරින්න හිතාගෙන කාමරය ලගට යද්දිම අදත්,

"මිනායා දුවලා එන්න පුතේ මේ ඇවිත් ඉන්නෙ කවුද බලන්න" අම්මා මිනායට කතා කලා.

මිනායා දුවලා ගිහින් බලනකොට ලිලි ඇවිත් එයාගේ අම්මලා එක්ක. දෙන්නට හරිම සතුටුයි. සතුට කියා ගන්න බැරි තරම්.

“ලිලි ඔයා අද ඉන්නවා නේද අපේ ගෙදර” මිනාය ඇසුවා.

“ඔව් පුතේ අම්මා කිවා ඔයා ගොඩක් පාලුවෙන් ඉන්නේ කියලා. ඒ නිසා අපි දවසක් දෙකක් නැවතිලා යන්න ආවේ” ලිලිගේ අම්මා මිනායාගේ හිස අතගාමින් පැවසුවා.

”අනේ ෂෝයි ෂෝයි ඒකනම් ෂෝයි” මිනායා සතුටින් උඩ පනිමින් නැටුවාය.

සියලු දෙනාම රාත්‍රිය ඉතා සතුටින් ගත කලා.

පසුදින සෙල්ලම් කරමින් සිටින අතරේ මිනායා ලිලිට අර කාමරය ගැන පැවසුවා.

“අපි දෙන්නාම එහෙනම් ඒක බලන්න යමුද” ලිලි යෝජනා කරා.

“ඒක නිකම් භූත කාමරයක් වගේ” මිනායා සිනාසෙමින් කිවාය.

“යමු යමු දැන්ම ම එහෙනම් භූත කාමරය බලන්න” ලිලි හදිසි කරමින් කීවාය.

මිනායා ලිලිවත් ඇදගෙන ඒ කාමරය ලගට දුවගෙන ගියා.

# භූත කාමරයේ අමුත්තෙක්

එයාලා කාමයේ දොර අරින්න උත්සහා කලත් ඒක ටිකක් අමාරු උනා.

"ලොක් වෙලා වගේ ඉන්නකෝ මම ට්‍රයි කරලා බලන්නම්." කියලා ලිලි කොණ්ඩ කට්ටක් දාලා දොර ලොක් එක ඇරියා. දොර ඇරගෙන දෙන්නාම අඩියක් කාමරය ඇතුලට තිබ්බා. කාමරය තනිකරම කලුවරයි. කිසිම දෙයක් පෙනුනේ නෑ. හැබැයි කාමරය ඇතුලෙන් කවුදෝ අඩන සද්දයක් වගේ ඇහුණා. දෙන්නාම මූනෙන් මූන බලා ගත්තා. එතකොටම කාමරයේ දොර වැහුනා. දෙන්නා හොඳදටම බය වුණා.

"කවුද මේ අඩන සද්දයක් ඇහෙන්නේ" ලිලියි මිනායායි හොදටම බයවෙලා වේවලන්න ගත්තා.

"හොල්මනක්වත් ද" ලිලි මිනායාව බදාගෙන ඇහුවා.

"අනේ මටත් බයයි මේකේ ලයිට් එකක් වත් නෑ දොරත් වැහුණා නේද" මිනායා කිව්වා.

"ඔයාගේ සාක්කුවේ අර පෑන වගේ ටෝච් එක තිබුණා නේද ඒක පත්තු කරන්නකෝ" ලිලි මිනායාට මතක් කරා.

"ආ ඔව්නෙ ඉන්නකෝ" මිනායා ටෝච් එක පත්තු කරා.

දෙන්නාම තාම බයට බදාගෙන ඉන්නේ. තාමත් අඬන සද්දේත් ඇහෙනවා. පොඩි ළමයෙක් වගේ කටහඩ නම්.

මිනාය ටෝච් එක සද්දේ එන පැත්තට ගැහුවා.

කාමරයේ මුල්ලේ පොඩි පිරිමි ළමයෙක් බිම ඉදගෙන අඬනවා. දෙන්නාම ටිකක් කලබල වුනා.

"ඔයා කවුද ඔයා හොල්මනක්ද" ලිලි බයෙන් වෙව්ල වෙව්ලා ඇහුවා.

"නෑ මම හොල්මනක් නෙමෙයි. අනේ මම ළමයෙක්" පොඩි පිරිමි ළමයා කිව්වා.

"බොරු නේද කියන්නේ? හොල්මනක් නෙමේ නම් ඔයා කොහොමද මේ කාමරයට ආවේ ඔයා හෝල්මනක් තමයි" මිනායා කිව්වා.

"අනේ නෑ මම ළමයෙක්. මට උදව් කරන්නකෝ මේ මාව අල්ලලා බලන්න බොරු නම්" ළමයා කිව්වා.

"අපි තව ලඟට ගිහින් බලමුද" මිනායා ලිලිට කිවාය.

දෙදෙනාම තව ළං වෙලා බැලුවා. ඇත්තටම මේ හොල්මනක් නෙමේ ළමයෙක්. එයාලා ළමයගෙන් වෙච්ච දේ ඇහුවා.

“අනේ මම මේ ගමට අලුතෙන් ආවේ. ගමේ ළමයි එක්ක සෙල්ලම් කර කර ඉන්නකොට එක ළමයෙක් මට අභියෝගයක් කලා. මම එයත් එක්කමයි ඊයේ දවල් මේ ගෙදරට ආවේ එතකොට ගෙදර කවුරුත් පේන්න හිටියේ නෑ දොරවල් ඇරලා තිබුණේ එයා මාව මේ කාමරයට එක්කන් ඇවිත් එයා එනකම් සද්ද නොකර ඉන්න කියලා ගියා. එයා තවම ආවේ නෑ.” ළමයා අඬ අඬා කිව්වා.

“අනේ පව් මිනායා මෙයා හොඳටම බය වෙලා ඉන්නේ. බඩගින්නේ ඇත්තේත්. අපි මෙයාව එළියට එක්කන් යමු” මුලින්ම ලිලි ළමයාව අල්ලලා නැගිට්ටෙව්වා.

“එන්න අපි යමු” යාලුවෝ දෙන්නා ළමයාව එළියට එක්කන් ආවා.

“අම්මේ අම්මේ පොඩ්ඩක් එන්නකෝ” මිනායා අම්මාට කථා කරා.

“කවුද පුතේ මේ” අම්මා බය වෙලා ඇහුවා.

මිනායා සහ ලිලි සම්පූර්ණ විස්තරය අම්මට කිවා. අම්මා ඉක්මනට ඒ ළමයට කන්න බොන්න දුන්නා.

"පුතේ ගෙදරින් හොදමට බය වෙලා ඔයාව හොයනවා ඇති" කියූ මිනායාගේ පියා ලිලිගේ පියා ද සමඟින් පාර අසමින් ඒ ළමයාව නිවසට ඇරලුවා.

කුඩා දරුවාව සොයා දීම සම්බන්ධයෙන් ඔහුගේ දෙමාපියන් බොහෝ සෙයින් ස්තුතිවන්ත වුණි.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ, සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-720-7